හරිත වැලි තොටුපල
பசுமை மணல் அகழ்விடம்
GREEN SAND FERRY

# හරිත වැලි තොටුපල නිර්මාණ තරගය

## තරග කොන්දේසි

- එක් එක් මංකඩ සඳහා කාර්යාංශය වෙත අදළ මුදල් ගෙවා වෙන වෙනම අයදුම්පත් යොමු කළ යුතුය.

- කැණීම් බලපත්‍රයේ මාසික කැණීම් ධාරිතාවය මත කාණ්ඩ 03 කට වෙන් කර ඇත. ඒ අනුව A,B,C ලෙස කාණ්ඩ 03 ක් යටතේ තරගය පවත්වනු ඇත.

  A - මාසික කියුබ් ධාරිතාවය 101 - 210 }
  B - මාසික කියුබ් ධාරිතාවය 36 - 100 } AL/A කාණ්ඩයේ බලපත්‍ර
  C - මාසික කියුබ් ධාරිතාවය 35 ට අඩු AL/B කාණ්ඩයේ බලපත්‍ර

- "ගංගා","ඔය","ඇළ","දොළ","ආර" ආශ්‍රිතව වැලි ගොඩ දැමීම සඳහා කාර්යාංශයෙන් කැණීම් බලපත්‍ර ලබාගෙන ඇති බලපත්‍රලාභීන් හට පමණක් මෙම තරගය සඳහා අයදුම් කළ හැක.

- තරගය සඳහා කාර්යාංශය විසින් නිකුත් කරන ලද අයදුම්පත පමණක් භාවිතා කළ යුතුය.

- සියලුම අයදුම්පත් අදාළ ප්‍රාදේශීය කාර්යාල වෙත 2022.03.31 දිනට පෙර කැණීම් බලපත්‍රයේ පිටපතක්ද සහිතව ලබා දිය යුතුය.

- තරගය සඳහා අයදුම්පත් භාරදුන් දිනයෙන් පසුව බලපත්‍රලාභීන් කැණීම් බලපත්‍රයේ කොන්දේසි උල්ලංඝනය කරමින් හෝ කැණීම් කටයුතු සම්බන්ධ යම් වැරදි ක්‍රියාවකට සම්බන්ධ වූ බවට තහවුරු වුවහොත් මෙම තරගයෙන් ඉවත් කිරීමට කටයුතු කරනු ඇත.

- මෙම තරගයට අදාළව විනිශ්චය මණ්ඩලය විසින් ගනු ලබන තීරණය අවසන් තිරණය වන අතර එම තීරණයට සියලුම අයදුම්කරුවන් එකඟ වීමට බැඳී සිටිය යුතුය.

- කිසියම් අයදුම්කරුවකුගේ බලපත්‍ර හිමිකාරීත්වය වෙනස් වන්නේ නම් ඒ බව අදාළ ප්‍රදේශයේ ප්‍රාදේශීය කැණීම් ඉංජිනේරු මඟින් කාර්යාංශයේ ප්‍රධාන කාර්යාලයේ හරිත තොටුපල සම්බන්ධීකරණ කාර්යාලය වෙත දැනුම් දීමට කටයුතු කළ යුතුය.

- කැණීම් බලපත්‍රයට අදාළ අනෙකුත් ආයතනවල නිර්දේශයන් හි කොන්දේසිවල යම් උල්ලංඝනය වීමක් සිදුවුවහොත්, එය තරගයෙන් ඉවත් කිරීමට සෘජුව බලපානු ඇත.

- යම් බලපත්‍රලාභියෙක් වෙනුවෙන් ඇටෝනි බලය ලබා දී විදේශගත වී සිටින යම් කැණීම් බලපත්‍රලාභියෙකු වේ නම් ඇටෝනි බලය සහිත නියෝජිතයාට අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතියට යටත්ව අයදුම්පත් ඉදිරිපත් කිරීමට අවස්ථාව ඇත.

- රාජ්‍ය හෝ පෞද්ගලික ආයතන අයදුම්කරුවන් හට අයදුම්පත් ආයතන ප්‍රධානියාගේ රබර් මුද්‍රාව සහිත අනුමැතියකින් ඉදිරිපත් කළ හැකිය.

- අයදුම්පත් තමාට කැමති එක් මාධ්‍යයකින් (සිංහල/දමිළ/ඉංග්‍රීසි) පමණක් ඉදිරිපත් කළ යුතුය.

- සෑම අයදුම්පතක්ම අදාළ ප්‍රාදේශීය කාර්යාලයේ ලියාපදිංචි කළ යුතුය.

- බලපත්‍රලාභීන් විසින් ප්‍රධාන කාර්යාලයට තැපැල් මඟින් හෝ රැගෙනවිත් භාරදෙන අයදුම්පත් මෙම තරගයට ඉදිරිපත් කරනු නොලැබේ.

**අධීක්ෂණය**

ජනාධිපති කාර්යාලය | පරිසර අමාත්‍යාංශය
මධ්‍යම පරිසර අධිකාරිය | දිස්ත්‍රික් ලේකම් කාර්යාල

**සංවිධානය හා මෙහෙයවීම**
**භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය**
**වැඩි විස්තර - සියලුම ප්‍රාදේශීය කාර්යාල මඟින් සහ**
**කාර්යාංශයේ වෙබ් අඩවියෙන් http\\www.gsmb.gov.lk**

GEOLOGICAL SURVEY & MINES BUREAU

හරිත වැලි තොටුපල
பசுமை மணல் அகழ்விடம்
GREEN SAND FERRY

# හරිත වැලි තොටුපල නිර්මාණය කිරීමට අදාළ උපදෙස් පත්‍රිකාව

- ප්‍රාදේශීය කාර්යාල මගින් ප්‍රධාන කාර්යාලය වෙත යොමු කරන හරිත වැලි තොටුපල නිර්මාණය කිරීමේ ක්‍රියාවලිය ආශ්‍රිත සියලුම අයදුම්පත් ඇගයීමට ලක් කරනු ඇත.
- තරග අයදුම්පත් කාණ්ඩ 03 ක් (A,B,C) යටතේ අදියර 03 කින් ඇගයීම් කරනු ලබයි.
- කැණීම් බලපත්‍රයේ සඳහන් සියලුම කොන්දේසි හා අනෙකුත් ආයතනවල නිර්දේශවලට අනුව පවත්වාගෙන යන වැලි මංකඩක් විය යුතුය.
- වැලි මංකඩක් සඳහා එක් ප්‍රවේශ මාර්ගයක් පමණක් පවත්වා ගත යුතු අතර, එහි උපරිම පළල අඩි 03 කට නොවැඩි විය යුතුය.
- පොළොව මට්ටමේ සිට අඩි 06 කට ඉහළින් සිටින ආකාරයට කාර්යාංශය විසින් ලබාදෙනු ලබන මංකඩට අදාළ නාම පුවරුවක් ස්ථිරව සවි කර තිබිය යුතුය.
- වැලි ගොඩ දැමීම සඳහා අනුමත බෝට්ටු සංඛ්‍යාව / ප්‍රමාණය පමණක් යොදා ගත යුතු අතර ඒවා අංකනය කර තිබිය යුතුය.
- ගං ඉවුරු ස්ථාවර කිරීමට පරිසර විද්‍යානුකූල ක්‍රමවේද යටතේ කටයුතු කළ යුතුය.
- "ලොරි රථ","ට්‍රැක්ටර් රථ" ගඟට ඇතුළු කිරීමට නොහැකි වන සේ ආරක්ෂිත වැටක් ඉදි කළ යුතුය.
- ආක්‍රමණශීලි ශාක වර්ග ඉවත් කිරීම මෙන්ම ගංගා පරිසර පද්ධතියට යෝග්‍ය ශාක වර්ග පමණක් කළ යුතුය.
- ගං ඉවුරු ආශ්‍රිතව ප්‍රදේශයට යෝග්‍ය "ශාක වර්ග","වැල් වර්ග" හා "තෘණ වර්ග" රෝපණය කර පවත්වාගෙන යාම හා දැනට පවතින ශාක වර්ග සංරක්ෂණය කර පවත්වාගෙන යාම.
- වැලි මංකඩ ආශ්‍රිතව "ප්ලාස්ටික්","පොලිතීන්","ෆයිබර්" කැබලි ආදි නොදිරන ද්‍රව්‍යය පරිසරයට බැහැර නොකළ යුතුය.
- වැලි ගොඩ දැමීමේ දී බෝල ගල් ආදිය ආපසු ගඟට, ඇළට මුදා හැරීමට කටයුතු කර තිබීම.
- ගං ඉවුරු ආශ්‍රිතව කුඹුක්, මී වැනි ගං ඉවුරු සංරක්ෂණයට උචිත පැළ සිටුවා ආරක්ෂා කර පවත්වා ගෙන යාම සඳහා ප්‍රමුඛතාවයක් සහිතව කටයුතු කළ යුතුය.
- ගං ඉවුරු ආශ්‍රිතව ගිනි තැබීම්, ගිනි මැල දැල්වීම සිදු නොකළ යුතුය.
- ඉවුරු ප්‍රදේශයෙන් බැහැරව/ඈත්ව (අවම වශයෙන් අඩි 12 ක්) සිටින සේ වැලි ගොඩ පවත්වා ගත යුතුය.
- ඇගයීම් කමිටුව, මංකඩ පරීක්ෂාවට ලක් කරන අවස්ථාවේදී බලපත්‍රලාභියා හෝ නියෝජිතයෙකු සහභාගි වීම අනිවාර්ය වේ.
- වැලි ගොඩ දැමීමට යොදා ගන්නා සේවකයින්ගේ ආරක්ෂාව සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග සහ පරිසරය සුරක්ෂිත කර ගැනීම සඳහා දක්වන උද්යෝගය සහ කැපවීම පිළිබඳව ඇගයීමට ලක් කරනු ඇත.
- මෙම තරගයේ ප්‍රතිඵල ලේඛනය ප්‍රාදේශීය කාර්යාලයේ සහ ප්‍රධාන කාර්යාලයේ ප්‍රදර්ශනය කරනු ලැබේ.
- කිසියම් අයදුම්කරුවෙකු හට මෙම තරගයෙන් ඉවත් වීමට සිදු වුවද මෙම ක්‍රියාවලිය අඛණ්ඩව පවත්වා ගෙන යා යුතු අතර ඉදිරියේ දී කැණීම් බලපත්‍ර දීර්ඝ කිරීමේ දී ඒ පිළිබඳව සලකා බලනු ලැබේ.
- යම් අයදුම්කරුවකු පළමු හා දෙවන වටයේ දී ඉදිරි වටය සඳහා තේරී පත් නොවන්නේ නම් එහෙත් තේරී පත්වීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති බව තමාට හැඟී යන්නේ නම් ඒ පිළිබඳව ප්‍රතිඵල නිකුත් කර දින 07 ඇතුළත අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත අභියාචනාවක් ඉදිරිපත් කළ හැක.
- විනිශ්චය මණ්ඩලය විසින් දෙනු ලබන ලකුණු පදනම් කර ගනිමින් කාර්යාංශයේ අනුමැතිය මත ජාතික හා දිස්ත්‍රික් මට්ටමෙන් තේරී පත්වන ජයග්‍රාහකයන් සඳහා වටිනා ත්‍යාග පිරිනමනු ලැබේ.

**අධීක්ෂණය**

ජනාධිපති කාර්යාලය
පරිසර අමාත්‍යාංශය
මධ්‍යම පරිසර අධිකාරිය
දිස්ත්‍රික් ලේකම් කාර්යාල

**සංවිධානය හා මෙහෙයවීම**
**භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය**
**වැඩි විස්තර - සියලුම ප්‍රාදේශීය කාර්යාල මඟින්**

GEOLOGICAL SURVEY & MINES BUREAU